## *විශේෂ ශිෂ්‍යත්ව වැඩමුළුව*

## විශේෂ ගණිතය ප්‍රශ්න පත්‍රය

**කාලය: පැය 1 විනාඩි 15**

නම : ....................................................................................

විභාග අංකය : ...........................................................

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:

- ඔබගේ නම ඉහත තිත් ඉර මත දක්වන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 5ක් ඇත. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- කටු සටහන් සඳහා කඩදාසි සපයනු ඇත.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 01 | |
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |

01.

a) “ එක් දහස් එකොළහ” යන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

..............................................

b) 100 001 යන සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

c) පහත දැක්වෙන ඒකක පරිවර්තනය කරන්න.

I. 800 cm , m වලට .....................................

II. 1200 g , kg වලට ......................................


d) පහත දැක්වෙන සංඛ්‍යා සුළුකර පිළිතුර දක්වා ඇති තිත්ඉර මත දක්වන්න.

I. 10 001 – 9991 = .............................

II. 1932 + 1956 – 1854 = .............................

e) රවුම තුල දී ඇති ඉලක්කම් භාවිත කරමින් 3න් හරියටම බෙදෙන ඉලක්කම් 2හි සංඛ්‍යා 2ක් ලියන්න.

............................ හා ..............................




f) පහත දැක්වෙන සංඛ්‍යා දී ඇති ඉඩ ප්‍රමාණයේ බෙදා දක්වන්න.

i. 4 | 1 0 6 0

ii. 3 | 9 3 6

g) ඔරලෝසු මුහුණතක් ඇඳ පස්වරු 3 පසුවී මිනිත්තු 30 යන වේලාව ඇඳ පෙන්වන්න.

h) දී ඇති ඉඩ ප්‍රමාණයේ සුළුකර දක්වන්න.

I. 435 x 6 = ..............................

II. 987 x 8 = ................................

i) 4032 යන සංඛ්‍යාව සනකරාමුවක දක්වන්න.

j) 4132 යන සංඛ්‍යාවේ 1 හි ඉලක්කමේ වටිනාකම කීයද? .................................

k) $\frac{1}{3}+\frac{1}{6}$ හි අගය සොයන්න.

02.

a) වෙළඳසැලක තබා ඇති මිල දර්ශනයක කොටසක් පහත දැක්වේ.

| | |
|---|---|
| කිරිපිටි පැකට් 1ක් | රු.350.00 |
| තේකොළ 1 kg ක් | රු.824.00 |
| සීනි 1 kg ක් | රු. 96.00 |

පාසලක ශ්‍රමදානයකට සහභාගී වූ අයට කිරි තේ ලබාදීම සඳහා පහත සඳහන් වගුවේ දැක්වෙන පරිදි ද්‍රව්‍ය මිලදී ගනු ලැබේ.

I. මිල දර්ශනයට අනුව වගුවේ හිස්තැන් පුරවන්න.

| මිලදී ගත ද්‍රව්‍ය | ප්‍රමාණය | මුදල | |
|---|---|---|---|
| | | රු | ශත |
| කිරිපිටි | පැකට් 4 | 1400 | 00 |
| තේකොළ | 250 g | .................... | .................. |
| සීනි | 2 kg | .................... | .................. |
| එකතුව | | .................... | .................. |

II. කිරි තේ සකස් කිරීමේදී පළමුව ලීටර 4 යි මිලිලීටර 750 ක් ද දෙවනුව ලීටර 3 යි මිලිලීටර 450ක් ද සකස් කෙරිණි. සැකසූ මුළු කිරි තේ පරිමාව කොපමණද?

b) 2016 වර්ෂයේ පරිසර දිනය වෙනුවෙන් 5 ශ්‍රේණියේ සිසුන් පිරිසක් විසින් තම පාසල් වත්තේ වගාකරන ලද මල් පැල වර්ග පිලිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ (Graph-1) දැක්වේ.


I. වගා කරනලද රෝස පැල සංඛ්‍යාව , කපුරු පැල සංඛ්‍යාව මෙන් දෙගුණයකි.

a. වගා කර ඇති කපුරු පැල ගණන කොපමණද?

b. වගා කරන ලද කපුරු පැල සංඛ්‍යාව ඉහත ප්‍රස්තාරයේ ඇඳ පෙන්වන්න.

II. අඩුවෙන්ම වගා කර ඇති පැල වර්ගයේ නම කුමක්ද?


III. වගා කර ඇති මුළු පැල සංඛ්‍යාව කොපමණද?




Graph - 1

03.

I.





a. මෙම රූපයේ ඇති හැඩය සමචතුරශ්‍රයක් කිරීමට එහි පළල පැත්තට තව cm කීයක් එකතු කල යුතුද?

b. සකස්කළ සමචතුරශ්‍රයේ වර්ගඵලය මුලින් තිබූ හැඩයේ වර්ගඵලය මෙන් කී ගුණයක්ද?

II. පහත දී ඇති රූපය ඇසුරෙන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

a. පාටකල කොටසේ වර්ගඵලය කොටු කීයකට සමාන වේද?

b. සෑම කුඩා කොටුවකම දිග 1 cm හා පළල 1 cm වේ. පාටකල කොටසේ වර්ගඵලය වර්ග සෙන්ටිමීටර කීයද?



04.

a) ළමයෙකුට දිනපතා උදේට හා හවසට විස්කෝතු 3 බැගින් කෑමට දෙනු ලැබේ.විස්කෝතු 72ක පැකට්ටුවක් මේ සඳහා දින කීයකට සෑහේද?

b) දුම්රිය ස්ථානයට ප.ව 12.50 ට පැමිණීමට නියමිත දුම්රිය මිනිත්තු 15 ක් පමාවන බව දැනුම් දෙන ලදී. ඒ අනුව දුම්රිය පැමිණෙනු ඇත්තේ කීයටද?

c) කෙසෙල් ගෙඩි 1 kg රු. 40.00 ක් වේ. 1 kg 250 g බරැති කෙසෙල් අවරියක මිල කීයද?

d) අභ්‍යාස පොත් 321 ක් පන්ති 3ක් අතර සමව බෙදන ලදී. එක් පන්තියකට ලැබුණු පොත් සංඛ්‍යාව කීයද?

e) භාජනයක් පිරවීමට ජලය 5 l 540 ml පරිමාවක් අවශ්‍ය වේ. එවැනි භාජන 4ක් පිරවීමට අවශ්‍ය ජලය පරිමාව කොපමණද?

f) 4 m ක් දිග 4 m උස බිත්තියක ගෑමට තීන්ත 2 l අවශ්‍ය වේ. 8 m දිග හා 1 m උස එවැනිම බිත්තියක තීන්ත ගෑමට අවශ්‍ය තීන්ත ප්‍රමාණය කොපමණද?

g) මිනිසුන් 4 දෙනෙකු එකම තැනින් පටන් ගෙන ඇවිද ගිය අතර පැය 4කදී ඔවුන් ගමන් කල දුර 16 km විය. පැය 1ක් තුල එක් මිනිසෙකු ඇවිද ගිය දුර කොපමණද?

h) අඹ ගෙඩියක හා දොඩම් ගෙඩි 2ක මිල රු.22 ක් වන අතර අඹ ගෙඩි 2 ක හා දොඩම් ගෙඩි 3ක මිල රු.36 ක් වේ නම්,

I. අඹ ගෙඩි 3ක හා දොඩම් ගෙඩි 5 ක මිල කීයද?

II. අඹ ගෙඩි 1ක හා දොඩම් ගෙඩි 1ක මිල කීයද?

05.

a) දැන් මාගේ වයස අම්මාගේ වයසෙන් හරි අඩකි. දැන් තාත්තා අම්මාට වඩා අවු.4 කින් වැඩිමල් වේ. තව අවුරුදු 2 කින් මාගේ අය්යාගේ වයස තාත්තාගේ වයසෙන් හරි අඩක් වේ. දැන් මාගේ අය්යාගේ වයස අවු.16 ක් නම් තව අවුරුදු 2 කින් මාගේ වයස කීයද?

b) බසයක් මගීන්ගෙන් පිරී පවතී. බසය ටික දුරක් යන විට මගීන් තිදෙනෙකු බැසගිය අතර එයට තවත් මගීන් 4 දෙනෙකු ගොඩවිය. එය තවත් ඉදිරියට යාමේදී එය තුලට තවත් මගීන් දෙදෙනෙකු ගොඩ විය. තවත් ඉදිරියට යාමේදී එක් මගියෙකු බැසගොස් තවත් දෙදෙනෙකු ගොඩවිය. දැන් බසයේ සිටින මුළු මගීන් ගණන 32ක් වේනම් ආරම්භක අවස්ථාවේ බසය තුල මගීන් කීදෙනෙකු සිටියේද?

*****